# ඒෂියන් ග්‍රැමර් පාසල
# පළමු වාර පරීක්ෂණය - 2019
# 11 – ශ්‍රේණිය
# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 01

නම:---------------------------- පන්තිය: --------------------------

සැකසුම : ධනුෂ්ක මාපාගෙදර

---

## I පත්‍රය

**සැලකිය යුතුයි.**

I. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

II. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (01), (02), (03), (04) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න

**අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න**

01. රටේ පවතින ජාතික ප්‍රශ්න හමුවේ වගකිව යුත්තන්ගේ <u>මුනිවත රැකීම</u> සැබැවින්ම ප්‍රහේලිකාවකි.

I. දැස් පියාගෙන සිටීම II. ආගම සිහි කිරීම

III. නිශ්ශබ්දව සිටීම. IV. ප්‍රශංසා කිරීම.

02. ඇතැම් පුද්ගලයන් <u>ඉවක් බවක් නැතිව</u> සිදු කරන වන විනාශයට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

I. ඉතා යහපත් ලෙස II. ඉතා නොසැලකිල්ලෙන්

III. අනායාසයෙන් IV. මහත් අභිමානයෙන්.

03. ඩෙංගු මර්දන ක්‍රියාවලිය <u>කටින් බතල සිටුවීමක්</u> නොවිය යුතුය.

I. අත්තනෝමතික ක්‍රියාවක් II. නිශ්ඵල ක්‍රියාවක්

III. අනවශ්‍ය ක්‍රියාවක් IV. වචනයෙන් පමණක් කරන ක්‍රියාවක්

අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. අන් අයගේ අදහස්වලට සවන් නොදී ----------------- ක්‍රියා කිරීම යහපත් ක්‍රියාවක් නොවේ.

I. අත්තනෝමතිකව II. පරාර්ථකාමීව

III. ඊර්ෂියාකාරී ලෙස IV. නිද්‍රාශීලීව

05. කථිකයාගේ වාග් චාතුර්ය ----------------- සිත් ඇද බැඳ තබා ගත්තේය.

I. රසිකයින්ගේ II. පාඨකයින්ගේ

III. ලේඛකයින්ගේ IV. ශ්‍රාවකයින්ගේ

06. සාහිත්‍ය පොත පතට ---------------- වුණු පුද්ගලයා දැනුම් කෝෂ්ඨාගාරයකි.

I. වියුක්ත II. ආසක්ත

III. විනිර්මුක්ත IV. සංයුක්ත

07. අකාරාදි පිළිවෙල නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න

I. විධානය, විනය, විනීත, විපරම

II. නිලය, නිවටයා, නිවස, නිර්මල

III. කැලල, කැවුම්, කැපීම, කැලය

IV. පදය, පදිංචිය, පහන, පරතරය

අංක 08 සිට 10 තෙක් ප්‍රශ්නවල සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න

08. I. ස්වභාවික, අවස්ථෝචිත, ප්‍රස්තාවනාව, ආධ්‍යාත්මික

II. පුස්තකාලය, න්‍යෂ්ඨික ප්‍රහාරය, යුධ රහස්, විද්‍යුත් උපකරණ

III. ව්‍යංග්‍යාර්ථය, විද්‍යාමාන, නිත්‍යනුකූල, කොට්ඨාසය

IV. නිෂ්ශබ්දතාව, ප්‍රේම වෘතාන්තය, දන්ත ශල්‍යාගාරය, අත්‍යාවශ්‍ය

09. I. විශ්ලේෂණය, ශ්‍රවණාගාරය, පර්යේෂණය, ජලාපවහණය

II. සමස්ත, ශිෂ්ටාචාරය, කණිෂ්ඨ, ගවේෂණය

III. විශ්මය, පුස්තකාලය, විශ්වාශය, ප්‍රදර්ශනය

IV. නිෂ්කලංක, නිශ්ශබ්ද, සංගයණාව, තීරණය

10. I. වර්ධනය, විද්‍යමාන, ජාත්‍යාලය, කණ්ණාඩිය

II. සමාර්ථ, ලේඛණය, උත්ප්‍රේක්සනය, මන්ත්‍රන

III. ස්ථාපිත, ප්‍රකාසනය, ගවේෂණය, උද්ඝෝෂනය

IV. නීත්‍යානුකූල, කාර්යාලය, පරිගණකය, ඥානය

11. උක්ත නාම පද පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

I. අප, ගැහැනියක්, කෙනෙක්, අයෙකු, කොතෙක්

II. නිළියක, මම, කලාකරුවෙකු, ගොවියෙකු, ගවයෝ

III. මම, තොපි, ඔබ, ගායකයෝ, ගවයෝ

IV. ගවයන්, අප, මම, මිනිසෙකු, තොපි

12. අර්ථයෙන් විරුද්ධ පද දෙකක් එකතු වී සෑදෙන යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

I. හොඳනරක, ඇත මෑත, ගොඩමඩ, ලාබඅලාභ

II. උඩබිම, සිරිතිවිරිත්, අයවැය, පිංපව්

III. ඇත්තනැත්ත, උස්මිටි, ඔබමොබ, යාම්ඊම්

IV. කෑමබීම, එහාමෙහා, ගුණාගුණ, පොතපත

13. යංශය, රාකාරාංශය, විසර්ගය, අනුස්වාරය, පාපිල්ල පිළිවෙළින් යෙදුණු පද පේළිය තෝරන්න.

I. විශේෂ්‍යය, සංග්‍රාමය, උපදේශනය, මණ්ඩලය, පුහුණුව

II. ව්‍යවහාරය, චන්ද්‍රිකා, අන්තඃපුරය, සංහිඳියාව, රුවල

III. සෞඛ්‍යය, කෛලාසය, උපක්‍රමය, අන්තඃඛණ්ඩය

IV. ප්‍රණාමය, චංචල, ප්‍රාර්ථනා, දුක්ඛදායක, නුවණ

අංක 14 සිට 16 වාක්‍යවල ඉරි ඇඳි වාක්‍යාංශ සඳහා යෙදිය හැකි තනි පදය ලියන්න.

14. නෙළුම්මල මඩෙහි උපදින අලංකාර පුෂ්පයකි

I. කණ්ඨජ II. පංකජ

III. ජලජ IV. අණ්ඩජ

15. රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව නැති අය පරිස්සම් විය යුතුය.

I. ප්‍රතිජීවනය II. ප්‍රතිචක්‍රීකරණය

III. ප්‍රතිශක්තිය IV. ප්‍රතිනිර්මාණය

16. නව මන්දිරයේ පශ්චිම පාර්ශවය ද දැකුම්කලු විය.

I. කෙළවර II. ඉදිරිපස

III. බටහිර පැත්ත IV. නැගෙනහිර පැත්ත

17. <u>නැටුම්, ගැයුම්, වැයුම්</u> අප සිතට ප්‍රහර්ශය ගෙන එයි. මෙහි ඉරි ඇඳි පදය අයත්වන ව්‍යාකරණ වර්ගය වන්නේ,

I. නිපාත II. උපසර්ග

III. තද්ධිත IV. කෘදන්ත

18. ඇද්දළ, නරනිඳු, රසාස්වාදය, උචිතානුචිත යන පද නිවැරදිව විසන්ධි කර ඇති වරණය තෝරන්න.

I. ඇද් + දළ, නර + නිඳු, රස + ආස්වාදය, උචි + තානුචිත

II. ඇත් + දළ, නරන් + ඉඳු, රස + ආස්වාදය, උචිත + අනුචිත

III. ඇත් + දළ, නරන්+ ඉඳු, රසාස් + වාදය, උචිත + අනුචිත

IV. ඇද් + දළ, නරන්+ ඉඳු, රස + ආස්වාදය, උචිත + නුචිත

19. මුලින් දැක්වෙන පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

I. හිරු - දිනිඳු, දිනකර, රවි, හිමකර

II. ජලය - අඹ, දිය, දල, පැන්

III. ලෝකය - දිය, ජගත්, ලොව, භුවන

IV. චන්ද්‍රයා - සොමි, සිසි, සඳ, තරිඳු

20 හා 21 ප්‍රශ්නවල දී ඇති වාක්‍යවල ඉරි ඇඳි පදයට විරුද්ධ පදය තෝරන්න

20.. එම ප්‍රශ්නය ඉතා <u>සරල</u> එකක් බව ඔහු කීවේය.

I. විරල II. පහසු

III. සංකීර්ණ IV. දුබල

21. එය හඳ පායා ඇති <u>නිසල</u> රාත්‍රියක් විය.

I. නිශ්චල II. සසල

III. සීතල IV. නිකසල

22 සිට 24 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

22. වැරදි ක්‍රියාවක නිරත වූ පුද්ගලයා ඒ පිළිබඳව නිරන්තරයෙන් පසු තැවීම.

I. අබ කෑ මිනිසාගේ නාහේ දන්නා වගේ

II. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ.

III. කපන්න බැරි අත ඉඹින්නා වගේ

IV. ගඟට ඉනි කැපුවා වගේ.

23. තමන්ට පුරුදු නැති කාර්යයක් කිරීමට ගොස් අපහසුතාවයට පත් වීම.

I. ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ

II. අනුන්ට කැපූ වළේ තමන් වැටුනා වගේ.

III. ගමරාල සිල් ගත්තා වගේ.

IV. ඉගුරු දී මිරිස් ගත්තා වගේ.

24. කිසියම් දෙයක යථා තත්වය නොදන විවිධ අදහස් පළ කිරීම

I. ඇටි කෙහෙල් කෑ උගුඩුවා වගේ.

II. ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ.

III. ආචාරියා රවටා කැත්ත හැදුවා වගේ.

IV. අන්ධයන් ඇතාගේ හැඩරුව කීවා වගේ.

25. අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.

I. හෙට මිනිසුන් වැඩට එතියි ඔහු සිතුවේය.

II. කෙනෙකු පාරේ ගමන් කර අනතුරට ලක් වී ඇත..

III. සුළං සැඩ වුනොත් ලොකු අනතුරකට මුහුණ දෙන්නට සිදුවන බව තාත්තා කීවේය.

IV. මිනිස්සු වෙහෙස මහන්සි වී වැඩ කරති.

26. "නටයි" යන ක්‍රියා පදයේ මධ්‍යම පුරුෂ බහු වචන අතීතකාල ක්‍රියා පදය යනු.

I. නටති. II. නැටුවෝය

III. නටන්නෙහි IV. නැටුවෙහු

27. "ඌෂ්මාක්ෂර පමණක් යෙදී ඇති වර්ණය තෝරන්න

I. ෂ, ෆ, ස, ළ, හ II. ක, ශ, ස, හ, ෆ

III. ප, එ, හ, බ, ම IV. හ, ස, ශ, ෆ, ෂ

**28 සිට 30 තෙක් ප්‍රශ්න වල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න**

28. I. දෙමාපියෝ සියල්ලන්ම රැස්වීමට සහභාගි වෙති.

II. දෙමව්පියෝ සියල්ලෝම රැස්වීමට සහභාගි වෙති.

III. දෙමාපියන් සියල්ලෝම රැස්වීමට සහභාගි වෙති.

IV. දෙමාපියන් සියල්ලන්ම රැස්වීමට සහභාගි වෙති.

29. I. ගුරුවරු ළමයි කැටුව චාරිකාව ගියහ.

II. ගුරුවරුන් ළමයි කැටුව චාරිකාව ගියහ.

III. ගුරුවරු ළමයින් කැටුව චාරිකාව ගියහ.

IV. ගුරුවරුන් ළමයින් කැටුව චාරිකාව ගියහ.

30. I. අම්මා හෝ මම හෝ ඔබ ගමට ගියෙමු.

II. අම්මා හෝ මම හෝ ඔබ ගමට ගියෝය.

III. අම්මා හෝ මම හෝ ඔබ ගමට ගියෙහි.

IV. අම්මා හෝ මම හෝ ඔබ ගමට ගියෙහු.

පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වරණය තෝරන්න

31. මනරම් වූ ආකර්ෂණීය වූ දූන්හිද දිය ඇල්ල පරිසරයේ සුන්දරත්වය වැඩි කරනවා

I. මනරම් වූ සුන්දර වූ දූන්හිද දියඇල්ල පරිසරය අලංකාර කරති.

II. මනරම් වූ ආකර්ෂණීය වූ දූන්හිද දියඇල්ල පරිසරයේ සුන්දරත්වය වැඩි කරන්නෝය.

III. මනරම් වූ සුන්දර වූ දූන්හිද දියඇල්ල පරිසරයේ සුන්දරත්වය වැඩි කරයි.

IV. මනරම් වූ සුන්දර වූ ආකාර්ෂණීය වූ දූන්හිද දියඇල්ල පරිසරයේ සුන්දරත්වය වැඩි කළාය.

32. රූපකයක් සහිත වරණය තෝරන්න.

I. පසළොස්වක සඳ පායනු වැන්නේ

II. වී පැදුරෙන් ඉගිලි යන කුරුල්ලෙකු ලෙසින්

III. දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා

IV. අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී.

33 සිට 34 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න

33. ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂණය කිරීම සඳහා වී වගාවට අත්‍යවශ්‍ය වන ජල සම්පාදනය උදෙසා මුලික අඩිතාලම වූ වැව් තැනවීම ලංකාවේ රාජ්‍ය පාලකයින්ගේ වැදගත්ම රාජ්‍යප්‍රතිපත්තියක් විය.

I. රට සහලින් ස්වයංපෝෂිත තත්වයට ගෙන ඒම සඳහා වී වගාව දියුණු කළ යුතු නම් ඊට අත්‍යාවශ්‍ය ජල සැපයුම සඳහා වැව් තැනවිය යුතු බව ලංකාවේ රාජ්‍ය පාලකයින් තේරුම් ගත්හ.

II. වී වගාවෙන් රට ස්වයංපෝෂණය කිරීම සඳහා රටට අවැසි ජලය සැපයීමට නම් වැව් තැනවීම අත්‍යාවශ්‍ය බව එකල ලංකාවේ රාජ්‍ය පාලකයින් තේරුම් ගෙන ඇත.

III. වී වගාව දියුණු කිරීමෙන් රට ස්වයංපෝෂණය කිරීමට නම් වැව් තැනවීම අත්‍යවශ්‍ය කාරණයක් බව ලංකාවේ රාජ්‍ය පාලකයෝ වටහා ගත්හ.

IV. වී වගාව දියුණු කිරීමෙන් රට සහල් වලින් ස්වයංපෝෂණය කළ හැකි බවත් ඒ සඳහා ජලය ලබා දීමට වැව් තැනවීම අත්‍යාවශ්‍ය බවත් රාජ්‍ය පාලකයෝ දැන සිටියහ.

34. ස්වභාව ධර්මය සකස් වී ඇත්තේ සාමය හා සමගිය උදෙසා වන අතර අසමගිය මිනිසා විසින් නිර්මාණය කර ගත්තකි.

I. අසමගිය මිනිසාගේ නිර්මාණයක් වන අතර සාමය හා සමගිය පරිසරයේ නිර්මාණයකි.

II. සොබාදහම මගින් සාමය හා සමගිය මුර්තිමත් වන අතර අසමගිය මිනිසාගෙන් මුර්තිමත් වේ.

III. සාමයත් සමගියත් සොබා දහමෙන් ලැබුණත් මිනිසා අසමගිය පතුරවයි.

IV. සොබා දහම සාමයත් සමගියත් වෙනුවෙන් සකස් වී ඇතත් මිනිසා අසමගිය නිර්මාණය කර ඇත.

35. ප්‍රථම ස්ථානය දිනාගත් සිසුවාට විදුහල්පතිතුමිය තිළින ------------------ කළාය.

I. ප්‍රධාණය　　II. ප්‍රධානය

III. ප්‍රදානය　　IV. ප්‍රදාණය

36. සංචාරකයන් රැගත් ගුවන්යානා කිහිපයක් බටහිර අහසේ පියාසර ------------------

I. කරති　　II. කරයි

III. කළෝය　　IV. කළෙහි.

37. ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ සමුළුව ------------------

I. ඇමතුහ.　　II. ඇමතුවෙහි.

III. ඇමතුවාය.　　IV. ඇමතුවේය.

38. පූර්ව ස්වර ලෝප සන්ධි පද පමණක් අයත් පිළිතුර තෝරන්න

I. සුරත, නළඟන, ගුණැති, ගිරග

II. ගිනියම්, නිරවුල්, නෙළුම් මල්, බුත් සරණ

III. ළිං වතුර, වැද්දා, කුරුල්ලා, දඬුවම්

IV. මලසුන, උනුත්, වටොර, පිළිතුර

39. ධීවර භාෂාවේදී "හැන්" යනු

I. කුඹ ගස

II. මසුන් මැරීම.

III. දැල

IV. වැහි කබාය.

40. මුලින් දැදී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න

I. ක්‍රියා විශේෂණ - අමාරුවෙන්, උවමනාවෙන්, වේගයෙන්, සෙමෙන්

II. කෘදන්ත - ගයන්නී, නැටුම, තොටිල්ල, පැවිල්ල

III. සර්ව නාම - අපි, එතුමා, මම, ඔබ

IV. නිත්‍ය බහුවචන - ඇතමෙක්, කෙනෙක්, අයෙක්, සමහරෙක්

**ඒෂියන් ග්‍රැමර් පාසල**

**පළමු වාර පරීක්ෂණය - 2019**

**11 - ශ්‍රේණිය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

කාලය පැය 02

නම:---------------------------- පන්තිය: -------------------------
-

සැකසුම : ධනුෂ්ක මාපාගෙදර

---

**II පත්‍රය**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. (I) සිට (X) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. පහත දැක්වෙන පදවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න

(අ) පතල (ආ) පතළ

II. පහත දැක්වෙන අකුරු ඇතුළත් කොට අර්ථවත් වචනය බැගින් ලියන්න

(අ) ඪ (ආ) ඣ

III. පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න

(අ) මිහින්තලය (ආ) අත්‍යුත්තම

IV. පහත එක් එක් වර්ගයට අයත් නිපාත පදය බැගින් ලියන්න.

(අ) සීමාර්ථයේ නිපාත

(ආ) භාවාර්ථයේ නිපාත

V. පහත වාක්‍ය ව්‍යාකරණානුකූලව නිවැරදි කර ලියන්න.

(අ) ශිෂ්‍යනායකයෝ උදෑසනින්ම පාසලට පැමිණ ඇත.

(ආ) ළමයින් හොඳින් ඉගෙන ගනිතියි දෙමව්පියන් සිතයි.

VI. පහත සඳහන් පද වලට විරුද්ධ පද ලියන්න.

(අ) ආගන්තුක (ආ) ස්වභාවෝක්තිය

VII. පහත සඳහන් ප්‍රකාශවලට අදාල ප්‍රස්තාව පිරුළු ලියන්න

(අ) පළි ගැනීමට නොහැකි නිසා පිළිගැනීම.

(ආ) අධමයින්ට උතුම් දෙයින් පලක් නැතිකම

VIII. පහත කර්මකාරක වාක්‍ය දෙක කර්තෘකාරකයට හරවා නැවත ලියන්න

(අ) අප විසින් සිඟින්නාට ආධාර දෙන ලදී.

(ආ) අතීත රජවරු විසින් මහ වැව් සෑදුණි.

IX. පහත සඳහන් වචන කාණ්ඩය ආකාරාදි පිළිවෙලට සකසන්න.

අක්වරුව, අක්යාල, අක්‍රිය, අක්ෂ, අක්මාව, අක්‍රෝධ

X. පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමු වැනි වචනය සමඟ දෙවෙනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවෙනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) කර්තෘ වැකි

(ආ) විශේෂ දෙසුම (ලකුණු 2X 10 = 20 යි)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න.

(අ) අපේ රටේ ජනගහනයෙන් වැඩි කොටසක් ජීවත් වන්නේ ගම්බද ප්‍රදේශවලය. ඔවුන්ගේ වැඩි දෙනෙකු ගොවිතැනින් ජීවත් වන අතර රටේ ඉඩම්වලින් විශාල කොටසක් යට වී ඇත්තේද ගොවිතැනටය. රටේ ස්වාධිනත්වය රැක ගැනීම සඳහා දරන ප්‍රයත්නයේදී ආහාර අතින් ස්වයංපෝෂණය වීම මුල් තැන ගනී. මේ කාර්යයෙහි ලා ක්‍රියාත්මක වන ව්‍යාපාර බොහෝය. පාසල් ළමයින් වශයෙන් අප ද එයට දායක විය යුතුය.

(ආ) සියලුම ජීව පද්ධතිවල පැවැත්ම සඳහා ස්වභාව ධර්මය දායාද කළ වටිනාම සම්පත ජලයයි. මිනිස් සිරුර තුළ 80% ක් පමණ ජල ප්‍රමාණයක් තිබෙන අතර අනෙකුත් සත්ත්වයන් තුළත් යම් ජල ප්‍රමාණයක් පවතී. විවිධ කාර්යයන් සඳහාද ජලය අත්‍යවශ්‍ය වේ. පැරැන්නෝ ජලය දේවත්වයෙහිලා පිදූහ. වර්තමානය වන විට ජලය සීඝ්‍රයෙන් දූෂණයට ලක්වෙමින් පවතී. නිසි ලෙස කලමණාකරණයක් ඇති කොට සොබා දහම තිළිණ කළ අනගි සම්පත රැක ගත යුතුය.

(ඉ) සාහිත්‍ය යනු සහෘදයා තුළ චමත්කාරයක් ජනනය වන පරිදි කරන ලද නිර්මාණයයි. එකී නිර්මාණ ගද්‍ය, පද්‍ය හා චම්පූ යනුවෙන් තෙවැදෑරුම් වන අතර එම නිර්මාණ හරහා රස ජනනය කිරිම මූලික අරමුණයි. සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාව කරා රැගෙන යාම එහිදී සිදු විය යුතුයි. සාහිත්‍ය පරිශීලනයට දරුවන් යොමු කිරීමෙන් සංවේදී යහපත් සමාකාමී සමාජයක් බිහි කිරීමට මඟ හසර එළිපෙහෙළි වනු ඇත.

(ඊ) රටක ජීවනාලිය බඳු දරු පරපුර වර්තමාන සමාජය විසින් බිලි ගෙන හමාරය. විශේෂයෙන් දිනෙන් දින දියුණු තලයට පාත්‍රවන විද්‍යා තාක්ෂණික ඥානය තුළින් නිර්මාණය වන ජංගම දුරකථන, පරිගණක ආදි උපකරණ යහපතට වඩා අයහපතට යොදා ගැනීමත් ඒ ඔස්සේ මත්‍රකුසාට බිලි වීම, විවිධ විසම සමාජ විරෝධී අපචාර ක්‍රියාවන්ට ගොදුරු වීමත් ඛේදවාචකයකි. එබැවින් මේ පිළිබඳව රටක් ලෙස ඉතා ප්‍රබල විමර්ශනයක් හා වැඩ පිළිවෙළක් අත්‍යවශ්‍යය.

(ලකුණු 25)

03. පහත දැක්වෙන ජේදය වචන 50 ත් 55 ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

වර්තමාන ලෝකයේ හැම රටකම පාහේ අවධානය සංවර්ධනය කෙරේ යොමු වී පවතී. පරිණාමය නමින් අප හඳුන්වන්නේ මේ සංවර්ධනයයි. එය යුගයෙන් යුගයට විවිධ ස්වරූප ගනිමින් නව ගොඩනැගිලි කර්මාන්තශාලා ආදිය බිහි කරයි. ගහ කොළ කැපී කෙටී යාම සතුන්ට ජීවත් වීමට ඇති ඉඩකඩ සීමා වීම, එහිදී ඇතිවන දෘශ්‍යමාන ප්‍රතිඵලයි. දීර්ඝ කාලීන සැලැස්මක් නොමැතිව සංවර්ධනයේ නාමයෙන් කෙරෙන පරිසර විනාශය සත්ත්ව වර්ගයාගේ විනාශයට අත වැනීමකි. තාක්ෂණික දියුණුව උපයෝගි කර ගනිමින් මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට මං පෙත් විවර කරගෙන ඇතත් ඒ බලවේග නිසා පරිසරයට සිදුවන හානිය වළක්වා ගැනීමට සිදු වී තිබීම අප ඉදිරියේ ඇති බලවත් අභියෝගයකි. ශාක පද්ධතිය නැති වීම වාතය අපිරිසිදු වීම ද ජල මට්ටම අඩු වීමටද ඉඩ ඇත. මේ කරණ කොට ගෙන කෘෂිකර්මය හා සත්තව පාලනය මිහි පිටින් අහෝසි වීමටද ඉඩ ඇති අතර පෘථිවියේ වසන සියලු ජීවීන්ගේ පැවැත්මටද එය ප්‍රබල අභියෝගයක් වී ඇත.

(ලකුණු 10)

04. පහත දැක්වෙන ජේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිලිතුරු සපයන්න

සත්‍ය සිද්ධියක් නැතහොත් සත්‍ය ප්‍රවෘත්තියක් පදනම් කරගෙන හෝ එසේ නැතහොත් සම්පූර්ණයෙන් කල්පිත ස්වරූපයක් හෝ නිර්මාණය කරනු ලබන හෙයින් නව කථාව කෙටි කථාව කෙටි නව කථාව යන සාහිත්‍යාංග තුන ද ප්‍රබන්ධ කථා හෙවත් කල්පිත කථා ගණයට වැටේ. දීර්ඝ ඉතිහාසයක් ඇති මේ ප්‍රබන්ධ කථාව විකාශනය වීමෙන් පළමුව නවකථාවකද ඉක්බිතිව නවකථාවේ ශාඛා දෙකක් ලෙස කෙටි කථාව හා කෙටි නව කථාවද යන නව සාහිත්‍යාංගත්‍රය ඒවාටම විශේෂ වූ ශිල්ප ධර්ම සහිතව දියුණු වූයේය. කෙටි කතාව ආරම්භ වූයේ දහනව වන ශතවර්ෂයේදී බව කියනු ලැබේ. අද ලෝ පුරා ව්‍යාප්ත ජනප්‍රිය සාහිත්‍යාංගයක් බවට පත්ව ඇති කෙටි කථාව වස්තු විෂය, කාර්ය සිද්ධිය, රචනාධර්ම යනාදි අංග විසින් නවතම ක්ෂේත්‍ර ගවේෂණය කරමින් සිටිනු පෙනේ.

I. නවකථා, කෙටිකථා, යන සාහිත්‍යාංග ප්‍රබන්ධ කතා ලෙස සලකනු ලබන්නේ ඇයි?

II. කෙටි කතාවේ ආරම්භය සිදු වූ බව සැලකෙන්නේ කවර ශතවර්ෂයේදී ද ?

III. මෙම ජේදයේ මුඛ්‍ය පරමාර්ථය කුමක්ද?

IV. පහත සඳහන් පදවල අර්ථය ලියන්න

(අ) කල්පිතයක් (ආ )විකාසනයක්

V. කෙටි කතාවේ වස්තුවිෂය යන්නෙන් මේ ලේඛකයා අදහස් කරන්නට ඇත්තේ කුමක්ද?

(ලකුණු 10)

05. කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේදී සිදු කෙරුණු සාකච්ඡාවකින් කොටසක් පහත දක්වේ මින් අදාල කරුණු පමණක් තෝරාගෙන වචන 100 කින් පමණ යුතු අත් පත්‍රිකාවක් සකස් කරන්න ප්‍රාදේශීය සභාවේ ලේකම් මහේන්ද්‍ර ජයලත් ඔබ යැයි සිතන්න.

I. ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශය තුළ එකතුවන කැලි කසල අපට විශාල ප්‍රශ්නයක්. වැහි කාලෙට වතුර බහින්නේ නෑ. මදුරුවෝ බෝ වෙනවා දුගඳ හමනවා.

II. හිස්ඉඩම්වලයි. පාරවල් අයින් වලයි. කුණු දමා යන්න මිනිසුන් පුරුදු වෙලා තියෙනවා

III. මෙම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩමුළුවක් හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරන්න ඕනෑ.

IV. මේ සඳහා දිරාපත් වන හා දිරාපත් නොවන අපද්‍රව්‍ය වෙන වෙනම ඉවත් කිරීමට අදාල භාජන අපි නොමිලේ ලබා දිය යුතුයි.

V. දිරාපත් වන අපද්‍රව්‍ය වලින් කාබනික පොහොර නිෂ්පාදනයට දිරිගන්වන්න පුළුවන්

VI. මේකට මිනිස්සු යොමු කරන්න අපි මොකද කරන්නේ ?

VII. අප ද්‍රව්‍ය කළමනාකරණය ගැන මිනිස්සුන්ව දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වමු ගම් මට්ටමින් ඒ වැඩමුළුව පවත්වලා මිනිස්සු දැනුවත් කරමු. කාබනික පොහොර නිෂ්පාදනයට මිනිස්සු හුරු කරවමු.

VIII. එහෙම නිපදවන කාබනික පොහොර ප්‍රාදේශීය සභාව මඟින් මිල දී ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරමු. ඒක ක්‍රමවත් විදිහට කරගෙන යන අයට තව තවත් ක්‍රමවත්ව කරගෙන යාමට මුදල් ආධාර ලබා දෙමු. මේ විදිහට කාබනික පොහොර නිෂ්පාදනය කරන අය අතුරෙන් 1, 2, 3, ස්ථාන තෝරලා ඒ අයට පිළිවෙළින් රුපියල් 50000, 35000, 25000 බැගින් ප්‍රදානය කරමු.

**නැතහොත්**

රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු බව ද ඊට සුදුසු ගොඩනැගිල්ලක් ඉදි කළ යුතු බවද දියසෙන්පුර එකමුතු යෞවන සමාජයේ මාසික රැස්වීමේදි තීරණය කෙරිණි. යෞවන සමාජයේ ලේකම් වන ගයාන් උඩවෙල ඔබ යැයි සිතා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සිදුවන සේවය පිළිබඳව අවධාරණය කරමින් දැනට ප්‍රජා ශාලාව පවතින භූමියේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවසර ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

( මේ සඳහා වචන 100ක් පමන ප්‍රමාණවත්ය)

(ලකුණු 15)